# නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

## සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම උදෙසා ව්‍යාපෘති යෝජනා (Project Proposal) සකස් කිරීමට බාහිර සම්පත් දායකත්වය ලබාගැනීම සඳහා ලියාපදිංචි කිරීම

2008 අංක 36 දරණ පාර්ලිමේන්තු පනත මගින් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය ස්ථාපිත කර ඇත. "සාඩම්බර ජීවිතයක් උදෙසා තිරසර නාගරික ජනාවාස ගොඩනැගීම" යන දැක්ම පෙරදැරිව "සුසැදි, සංයුක්ත හා සුරැකි බව රැඳුණු නාගරික ජනාවාස ගොඩනැගීම සහ භෞතික, සාමාජීය සහ ආර්ථික වශයෙන් ප්‍රජාවන් සවිබල ගැන්වීම" මෙහෙවර ලෙස ගනිමින් මෙම අධිකාරිය විසින් භෞතික සංවර්ධන හා සමාජ සංවර්ධන ලෙස දෙවැදෑරුම් ප්‍රවේශයන් ඔස්සේ නිවාස ව්‍යාපෘතින් හා සමාජ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

අධිකාරියෙහි ප්‍රධාන පරමාර්ථය වන්නේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශිත නාගරික ප්‍රදේශවල ජීවත් වන අඩු පහසුකම් හා අඩු ආදායම්ලාභී ප්‍රජාව සහ මධ්‍යම පාන්තික ප්‍රජාව වෙත ඔවුන්ගේ නිවාස ගැටලුවලට විසඳුම් ලබා දෙමින්, සමාජ සංවර්ධන වැඩසටහන යටතේ ඔවුන් සමාජ, ආර්ථික, අධ්‍යාපනික, සෞඛ්‍ය, ආගමික හා සංස්කෘතිකමය වශයෙන් ජීවන තත්ත්වය ඉහළ නැංවීම හා ඔවුන් තුළ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කර ඔවුන්ව ස්වශක්තියෙන් යුතුව ඔසවා තැබීමට අවශ්‍ය සහයෝගය ලබාදීම වේ.

එසේම "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව "සුවපහසු නිවසක් සනීපාරක්ෂක ජීවිතයක්" ලබාදීමේ අරමුණ පෙරදැරිව, දීපව්‍යාප්තව අඩු ආදායම්ලාභී ප්‍රජාව වෙත සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් නවමු මුහුණුවරකින්, වඩාත් පුළුල් පරාසයක් ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීමට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය බලාපොරොත්තු වේ.

එබැවින් පනත ප්‍රකාරව ජාතික අවශ්‍යතාවයන්ට හා රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුගතව මානව හා භෞතික සංවර්ධන වැඩසටහන සකස් කර ක්‍රියාත්මක කිරීමට ඊට අදාල ව්‍යාපෘති යෝජනා සැලසුම් සකස් කර සම්පාදනය කර ගැනීම වෙනුවෙන් පැවරුම් පදනමින් (Assignment Basis) ඒ හා සම්බන්ධ විෂය ප්‍රවීන බාහිර සම්පත් දායකයින්ගෙන් අදාළ කාර්යන් ඉටු කර ගැනීම අපේක්ෂා කෙරේ.

ඒ සඳහා පහත අවම සුදුසුකම් සපුරාලන මේ සමග සඳහන් කර ඇති විෂය ක්ෂේත්‍රයන්හි විෂය ප්‍රවීන බාහිර සම්පත් දායකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**විෂය ක්ෂේත්‍රයන් :-**

1. නාගරික සංවර්ධනය
2. නිවාස සහ යටිතල පහසුකම්
3. සමාජ සංවර්ධනය
4. ජීවනෝපාය සහ ව්‍යවසායකත්වය
5. ප්‍රජා සංවර්ධනය
6. පරිසරය සහ දේශගුණය
7. මහජන සෞඛ්‍යය
8. අධ්‍යාපනය සහ තරුණ සංවර්ධනය
9. අධීක්ෂණය සහ ඇගයීම
10. ආයතනික සංවර්ධනය

උක්ත ක්ෂේත්‍ර යටතේ රාජ්‍ය ආයතන සඳහා උපදේශන සේවය ලබා දී ඇති සම්පත්දායකයන් සඳහා ප්‍රමුඛත්වය ලබා දේ.

එබැවින්, මේ සම්බන්ධ විෂය ප්‍රවීන බාහිර සම්පත් දායකයින්ගෙන් අයදුම්පත් කැඳවීම ආරම්භ කර ඇති අතර, ඒ සඳහා ජීව දත්ත පත්‍රිකාව ද සමග පහත දිගුව ඔස්සේ (Google form) ලියාපදිංචි වීම සිදුකළ යුතු ය. සුදුස්සන් තෝරා ගැනීම සම්බන්ධයෙන් අවසන් තීරණය නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය සතු වේ. මේ සඳහා කිසියම් බලපෑමක් සිදුකරනු ලබන අයදුම්කරුවන් සුදුසුකම් නොලබන අයදුම්කරුවන් සේ සැලකේ.

ඔබගේ අයදුම්පත දින 07ක් ඇතුලත එනම් 2026.03.05 වන දිනට ප්‍රථමව යොමු කරන මෙන් මෙයින් දැනුම් දෙමි. (වැඩිදුර විස්තර සඳහා - 0112871306)

https://docs.google.com/forms/d/e/1FAIpQLSd4pnSrpR1QqajtoxyFj4QmPeUyu_HgphPpbIuEU9AvmHqYag/viewform?usp=publish-editor


**සභාපති**
**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය**
**09 වන මහල**
**සෙත්සිරිපාය, බත්තරමුල්ල**
**වෙබ් අඩවිය :- https://usda.gov.lk/**